2008ක් වූ අගෝස්තු මස 1 වැනි දින දී ය.

08-163

# රටබීම විකිණීමේ බලපත්‍ර සඳහා හා අයදුම්පත්

### හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම - 2009

2009 ජනවාරි මස 01 දින සිට 2009 දෙසැම්බර් මස 31 දින දක්වා කාලය තුළ විදේශ මත්පැන් (ධාන්‍ය මත්පැන් ඇතුළුව) විකිණීම කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාලව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් විදේශ මත්පැන් තැබෑරුම් සඳහා ටෙන්ඩර් බාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයෙන් දක්වා ඇති ටෙන්ඩර් මුදල් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාල ටෙන්ඩරයේ සඳහන් මුදලෙන් යටත් පිරිසෙයින් (15%) වටිනාකමට ලබාගත් වත්කම් සහතිකයක් ද ඊට ඇමිණිය යුතුය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරෙහි අංක......................................... දරන ..........................................විදේශ මත්පැන් තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය යනුවෙන් පහත සඳහන් උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කර 2008.08.14 දින පෙ. ව. 10.30ට පෙර හලාවත ප්‍රාදේශීය ලේකම් වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. නැතහොත් එම වේලාවට පෙර හලාවත ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

04. 2009 වර්ෂය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 දින පළවී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ දැක්වෙන විදේශ මත්පැන් තැබෑරුම් කොන්දේසිවලට අනුකූල විය යුතුය.

05. 2008.08.14 දින පෙ. ව. 10.30ට ටෙන්ඩර් පත්‍ර බාරගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියළුම ටෙන්ඩර්කරුවන් හලාවත ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ පෙනීසිටිය යුතුය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ විදේශ මත්පැන් තැබෑරුම් නැවත විකිණීම 2008.09.26 දින පෙ. ව. 10.30ට සිදුකරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ අවශ්‍යාවයන්ට අනුකූලව විය යුතුය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර හලාවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය. (දුරකථන අංකය 032 - 2223205).

යූ. එස්. එන්. ප්‍රනාන්දු,
ප්‍රාදේශීය ලේකම්/හලාවත.

ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,
හලාවත.
2008 ජූලි මස 14 වැනි දින.

**උපලේඛනය**

| *කොට්ඨාසය* | *ග්‍රාමය* | *ටෙන්ඩර් භාරගන්නා දිනය හා වේලාව* | *ටෙන්ඩර් භාරගන්නා දෙවන දිනය හා වේලාව* | *තැබෑරුම් විවෘත කරන වේලාව* | *තැබෑරුම් වහන වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල* |
|---|---|---|---|---|---|---|
| හලාවත | අංක : 07 කොටස පිටිපන වීදිය හලාවත | 2008.08.14 පෙ. ව. 10.30 | 2008.09.26 පෙ. ව. 10.30 | පෙ. ව. 11.00 ප. ව. 5.00 | ප. ව. 2.00 ප. ව. 8.00 | 500 |
| හලාවත | අංක : 06 කොටස කඩවීදිය, හලාවත | -එම- | -එම- | -එම- | -එම- | 1,500 |

08-123

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## ලංකා බැංකුව

### ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005.08.18 දිනැති අංක 1407 දරන ගැසට් පත්‍රයේ හා 2005.08.08 දිනැති ඩේලිනිවුස්, දිනමිණ හා තිනකරන් යන පුවත්පත්වල පළ කරනලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගත හැකි මුල් මුදලේ ශේෂයද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළියද, ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල හා පරිශ්‍ර පිහිටි ස්ථානයේදී ම 2008 සැප්තැම්බර් මස 20 වැනි දින පෙ.ව. 11.00ට කොළඹ 05, හැව්ලොක් පාර, අංක 290 හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

**විකිණීමට ඇති දේපළ**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේපත්තුවේ, කොළඹ මහ නගර සභා සීමාවේ බෙල්මන්ට් වීදියේ පිහිටියා වූ ද, බෙල්මන්ට් වීදිය වරිපනම් අංක 39 දරන ඉඩම බලයලත් මිනින්දෝරු නෝමන් ජේ ස්මිත් විසින් සාදන ලද 1961 ජනවාරි 22 දිනැති අංක 251/61 දරන පිඹුරේ විස්තර කළ ලොට් 17 වශයෙන් සඳහන් බෙදන ලද්දා වූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට: ලොට් 1 ද, නැගෙනහිරට: ලොට් 18 ද , දකුණට: බෙල්මන්ට් වීදිය ද, බස්නාහිරට :ලොට් 16 ද, මායිම්ව එකී අංක 251/61 දරන පිඹුර අනුව පර්චස් එකයි දශම හතරයි අටක (අක්කර 0, රූඩ් 0, පර්චස් 1.48) ප්‍රමාණයෙන් යුතු ඉඩම සමඟ එහි පිහිටි සියලු දේ වේ.

මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 899/102 හි ලියාපදිංචි කර ඇත.

ලොට් 17 වශයෙන් සඳහන් එකී ඉඩම් කැබැල්ල බලයලත් මිනින්දෝරු ඒ. ඩී. එම්. ජේ. රූපසිංහ විසින් සාදන ලද 1992 මාර්තු මස 20 දිනැති අංක 610 දරන මෑත මිණුම් පිඹුරේ පහත සඳහන් පරිදි විස්තර කර ඇත :-

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාවේ කෙහෙල්වත්ත, කොට්ඨාස අංක 18 තුළ පිහිටියාවූ ද, බෙල්මන්ට් වීදියේ වරිපනම් අංක 39 දරන සහ එකී අංක 610 දරන පිඹුරේ විස්තර කළ ලොට් අංක 1 වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ හා නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට බෙල්මන්ට් වීදිය වරිපනම් අංක 37 දරන පරිශ්‍රය සහ අංක 603/සීඑච්/ඕ/830/4163 දරන පිඹුරේ ලොට් 3 ද, නැගෙනහිරට ස්මිත් වීදියේ වරිපනම් අංක 20 දරන පරිශ්‍රය සහ බෙල්මන්ට් වීදියේ වරිපනම් අංක 41 දරන පරිශ්‍රය ද, දකුණට බෙල්මන්ට් වීදියේ වරිපනම් අංක 41 දරන පරිශ්‍රය සහ බෙල්මන්ට් වීදිය ද, බස්නාහිරට බෙල්මන්ට් වීදිය සහ බෙල්මන්ට් වීදියේ වරිපනම් අංක 37 දරන පරිශ්‍රය ද, මායිම්ව එකී අංක 610 දරන පිඹුර අනුව පර්චස් එකයි දශම හතරයි නවයක (අ. 0 රූ. 0 පර්. 1.49) බිම් ප්‍රමාණය සමග එහි පිහිටි සියලු දේ වේ.

තවද, බෙල්මන්ට් වීදියේ පිහිටියා වූ ද, බලයලත් මිනින්දෝරු නෝර්මන් ඒ. ස්මිත් විසින් සාදන ලද 1961 ජනවාරි මස 22 දිනැති අංක 251/61 දරන පිඹුරේ විස්තර කළ ලොට් 1 වශයෙන් සඳහන් (විවෘත ස්ථාන) ඉඩම් කැබැල්ල දිගේ සහ මත මාර්ග අයිතිය සමඟ පර්චස් එකයි දශම හයයි බිංදුවක (අක්කර 0, රූඩ් 0, පර්චස් 1.60) ප්‍රමාණයෙන් යුක්තවේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ889/51 හි ලියාපදිංචි කර ඇත.

අයි. එම්. පණ්ඩිතරත්න මිය,
කළමනාකාරිණි,
අයකරගැනීම් හා ණය සුපරීක්ෂණ.

ලංකා බැංකුව,
අගනුවර ශාඛාව,
අයකරගැනීම් හා ණය සුපරීක්ෂණ දෙපාර්තමේන්තුව,
කොළඹ 01.

08-192

---

## මහජන බැංකුව - දියතලාව ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

රත්නපුර දිස්ත්‍රික්කයේ, කොලොන්න කෝරළයේ, කොලොන්න ගම්පත්තුවේ, කොලොන්න ප්‍රාදේශීය සභා සීමාව තුළ ඉටිකන්ද පිහිටි නිදන්කැපුහේන යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම ගොඩනැගිලි සහ පරිශ්‍රය මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2008.08.29 වැනි දින පෙ. ව. 10.00ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ පිළිබඳ විස්තර.* - බලයලත් මිනින්දෝරු ඒ. රත්නම් මහතා විසින් 1997.05.17 වැනි දින සකස්කරන ලද අංක 6016 දරන පිඹුරේ කැබලි අංක 01 ප්‍රමාණයෙන් අක්කර 01, රූඩ් 00, පර්චස් 15ක් වූ ගොඩනැගිලි ඇතුළු සියළුම දේත්.

2004.03.26 වෙනි දින රජයේ *ගැසට් පත්‍රයේ* හා 2006.04.07 සහ 2006.04.10 වැනි දින දිනමිණ, ඩේලිනිවුස්, යන පුවත්පත් වල පලකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*- රක්වාන දෙනියාය පාරේ සූරිය කන්දේ සිට කි. මී. 7ක් පමණ යන විට හමුවන සිංහරාජ මහ විද්‍යාලය පසුකර මීටර් 200ක් 250ක් පමණ යන විට මෙම දේපළ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

01. ගැණුම් මිළෙන් 10% ද,
02. පළාත් පාලන ආයතනයට 1% ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් 2 1/2% ද,
04. ලිපිකරු සහ නිවේදන ගාස්තු වශයෙන් රු. 500ක් ද,
05. විකුණුම් වියදම් හා වෙනත් ගාස්තු වෙතොත් එම මුදලද, විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.
06. ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත සහකාර සාමාන්‍යාධිකාරි තුමා (ඌව කලාප), මහජන බැංකුව කලාප කාර්යාලය, අංක 24, ආර්. එච්. ගුණවර්ධන මාවත, බදුල්ල වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක : 055 2222165/055 2223068.
ෆැක්ස් අංකය : 055 2222361.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැකිය.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කල මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩබ්. ජයතිලක,
සාමවිනිසුරු,
උසාවි කොමසාරිස්,
ප්‍රසිද්ධ වෙන්දේසිකරු සහ තක්සේරුකරු.

අංක 48/1, කළුගල්පිටිය,
බදුල්ල.
දුරකථන අංකය : 055 2230846.

08-26

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. - ගාල්ල කොටුව ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී. කිව්. 116) විසින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර.

1. බලයලත් මානක ඒ. ආර්. ඩයස් අබේගුණවර්ධන විසින් 1959 අගෝස්තු මස 21 වැනි දින සාදන ලද අංක 723 දරණ පිඹුර පරිදි දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, කඩවත් සතරේ, ගාල්ල මහ නගර සභා සීමාව තුළ ගාල්ල කොටුවේ පිහිටි ගොඩනැගිල්ලේ පෙර අංක 8 1/2 ලෙස ලකුණු කොට තිබුණු පසුව මහ නගර සහා වරිපනම් අංක 10 දැරූ සහ දැනට වරිපනම් අංක 21 දරන මෙම ඉඩමේ ලොට් 'ඒ' ලෙස බෙදා වෙන් කරන ලද, පර්චස් දහසයයි දශම එකයි දෙකයි පහක් (අ.0 රූ.0 පර්. 16.125) විශාල ඉඩම

2. එකී ගාල්ල කොටුවේ පිහිටි පෙර අංක 8 1/2 ලෙස ලකුණු කොට තිබුණු හා පසුව මහ නගර සහා වරිපනම් අංක 10 දැරූ සහ දැනට වරිපනම් අංක 21 දරන ගොඩනැගිල්ලේ මාරුවීමේ මාර්ගය සඳහා ලොට් 'බී' වශයෙන් ලකුණු කොට අංක 723 දරන පිඹුර පරිදි පර්චස් එකයි දශම හයයි බිංදුවයි බිංදුවක් (අ. 0 රූ. 0 පර්. 1.600) විශාල ඉඩම.

මොහොමඩ් ශාෆි මොහොමඩ් රිෆේ හෙවත් මොහොමඩ් ශාෆි මොහොමඩ් රිෆායි ණයකරු හැටියට ද, ඔහු විසින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට උකස් කරන ලද ඉහත සඳහන් කල දේපළ.

වර්ෂ 2008 ක්වූ අගෝස්තු මස 26 වන දින ප. ව. 1.00 ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2007.08.31 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* සහ දිවයින, ද අයිලන්ඩ්, සහ තිනකරන් පුවත්පත් බලන්න.

විකිණීම පිළිබඳ දැන්වීම් සඳහා 2008.08.01 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2008.08.04 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ තිනකරන් පුවත්පත් බලන්න.

ඉඩමට පිවිසීම :

*(අ)* ගාල්ල කොටුව කොටු පවුර වීදියේ මධ්‍යයෙහි ඇති මංසන්දියේ සිට යාර 50 ක් පමණ නුදුරින් ගාල්ල කොටුවේ, මැද වීදිය අංක 21 දරන ස්ථානයේ මෙම දේපළ පිහිටි ඇත.

*(ආ)* මෙම දේපල මැද වීදියට ආසන්නව උතුරු-නැගෙනහිර දෙසින් පිහිටා ඇත. ගිණිකොන දිග කෙළවරෙහි කොටු පවුර වීදියට යෑම සඳහා ප්‍රවේශ මාර්ගයක් ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- විකිණීම ස්ථිර කල වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිළෙන් සියයට දහයක් (10%),
2. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (01%),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් ගැනුම් මිලෙන් සියයට දෙකයි දශම පහක් (2.5%),
4. නොතාරිස් ගාස්තුව රු. 2000,
5. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500,
6. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
7. ගැණුම් මිළෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුලදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ ගාල්ල කොටුව ශාඛාවේ තැන්පත් කළ යුතුය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු,
බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්
කොළඹ වාණිජ මහාධිකරණය සහ
දිසා අධිකරණය,
බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
රාජ්‍ය සහ වාණිජ බැංකු,
අංක 99, උසාවිය පාර, කොළඹ 12.
දුරකථන/ෆැක්ස්: 2445393.

කළමනාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.
අංකː 22, පල්ලිය වීදිය, කොටුව.
ගාල්ල.
දුරකථන අංකː 091-2232223, 091-2234377,
ෆැක්ස් අංකය : 091-2242770.

08-202

## ලංකා බැංකුව

### ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 22 වෙනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ලංකා බැංකු ආඥාපනතේ 19 වෙනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2008.04.11 දිනැති අංක 1545 දරන *ගැසට් පත්‍රයේ* හා 2008.04.04 දිනැති දිණමින, ඩේලිනිව්ස්, තිනකරන් යන පුවත්පත්වල පළ කරනලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගතහැකි මුල් මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවියයුතු පොලිය ද, ගාස්තු හා මුදල් ද අයකරගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල හා පරිශ්‍ර පිහිටි ස්ථානයේදීම 2008.08.21 වැනි දින පෙ. ව. 11.30 ට කෝට්ටේ, පිටකෝට්ටේ අංක 474, මහානාම ඩ්‍රයිව් හි පදිංචි වෙන්දේසිකාර ආර්. එස්. මහානාම මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

විකිණීමට ඇති දේපල

#### ඉහත සඳහන් උපලේඛනය

1. බස්නාහිර පළාතේ, මීගමුව ලියාපදිංචි කොට්ඨාශයේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු, කෝරළයේ, දූනගහපත්තුවේ, කැලෑපිටිමුල්ල ග්‍රාමයේ පිහිටි විනිප්‍රඩ් එස්ටේට් නැමැති ඉඩමෙන් ලොට් 22 වශයෙන් සඳහන් ඉඩම් කැබැල්ල උතුරට : එම ඉඩමේ ලොට් 23 ද, නැගෙනහිරටː කේ. විමලසේනගේ ඉඩම ද, දකුණට : මීගමුව සිට දිවුලපිටිය දක්වා මහා මාර්ගය ද, බස්නාහිරට : අඩි 20 ක් පළල වෙන්කල පාර වශයෙන් සඳහන් ලොට් 45 ද, මායිම්ව බලයලත් මිනින්දෝරු වෝල්ටර් ඒ ප්‍රනාන්දු විසින් සාදන ලද 1980 ඔක්තෝබර් මස 09 දිනැති අංක 3198 දරන පිඹුර අනුව ගහකොළ වැවිලි සහ පිහිටි සියලු දේ වේ. මෙය මීගමුව ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 662/66 හි ලියාපදිංචි කර ඇත.

2. එකී කැලෑපිටිමුල්ල ග්‍රාමයේ පිහිටි විනිප්‍රඩ් එස්ටේට් නැමැති ඉඩමෙන් ලොට් 23 වශයෙන් සඳහන් ඉඩම් කැබැල්ල උතුරට : එම ඉඩමේ ලොට් 24 ද, නැගෙනහිරට : කේ. විමලසේනගේ ඉඩම ද, දකුණට : එම ඉඩමේ ලොට් 22 ද, බස්නාහිරට : අඩි 20 ක් පළල පාරක්වූ එම ඉඩමේ ලොට් 45 ද, මායිම්ව එකී අංක 3198 දරන පිඹුර අනුව පර්චස් විස්සක (අ0. රූ 0. පර්. 20) බිම් ප්‍රමාණය සමග එහි පිහිටි ගහකොළ වැවිලි සහ සියළු දේ වේ. මෙය මීගමුව ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 662/67 හි ලියාපදිංචි කර ඇත.

3. එකී කැලෑපිටිමුල්ල ග්‍රාමයේ පිහිටි විනිප්‍රඩ් එස්ටේට් නැමැති ඉඩමෙන් ලොට් 24 වශයෙන් සඳහන් ඉඩම් කැබැල්ල උතුරට : එම ඉඩමේ ලොට් 25 ද, නැගෙනහිරට : කේ. විමලසේනගේ ඉඩම ද, දකුණට : එම ඉඩමේ ලොට් 23 ද, බස්නාහිරට : අඩි 20 ක් පළල පාරක් සඳහා වෙන්කළ එම ඉඩමේ ලොට් 45ද, මායිම්ව එකී අංක 3198 දරන පිඹුර අනුව පර්චස් විස්සක් (අ 0. රූ 0. පර්. 20) බිම් ප්‍රමාණය සමග ගහකොළ වැවිලි සහ පිහිටි සියලු දේ වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 662/68 හි ලියාපදිංචි කර ඇත.

#### දෙවන උපලේඛනය

4. එකී කැලෑපිටිමුල්ල ග්‍රාමයේ පිහිටි විනිප්‍රඩ් එස්ටේට් නැමැති ඉඩමෙන් ලොට් 45 (අඩි 20 ක් පළල පාරක් සඳහා වෙන්වූ) වශයෙන් සඳහන් ඉඩම් කැබැල්ල උතුරටː එම ඉඩමේ ලොට් 35 ද, නැගෙනහිරටː එම ඉඩමේ ලොට් 22 සිට 34 දක්වා ද, දකුණට : මීගමුව සිට දිවුලපිටිය දක්වා මහා මාර්ගය ද, බස්නාහිරට : එම ඉඩමේ ලොට් 15 සිට 21 දක්වා ද, එම ඉඩමේ ලොට් 43 සහ 42 ද, එම ඉඩමේ ලොට් 38 සහ 39 ද මායිම්ව එකී අංකː 3198 දරන පිඹුර අනුව රූඩ් එකයි පර්චස් විස්සක

(අ 0. රූ. 1 පර්. 20) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 662/228 හි ලියාපදිංචි කර ඇත.

ඩී. පී. ඩී. හේමතිලක,
කළමනාකරු.

ලංකා බැංකුව,
දිවුලපිටිය.

08-195

---

## ලංකා බැංකුව

### ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 22 වෙනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ලංකා බැංකු ආඥාපනතේ 19 වෙනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2000.04.28 දිනැති අංක 1.130 දරන *ගැසට් පත්‍රයේ* හා 2000.04.20 දිනැති දිණමින, ඩේලිනිව්ස්, තිනකරන් යන පුවත්පත්වල පළ කරනලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගතහැකි මුල් මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවියයුතු පොලිය ද, ගාස්තු හා මුදල් ද අයකරගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල හා පරිශ්‍ර පිහිටි ස්ථානයේදීම 2008.08.23 වැනි දින පෙ. ව. 10.00 ට මාතර, කොටුව විල්ප්‍රඩ් ගුණසේකර මාවත අංක 39 හි පදිංචි වෙන්දේසිකාර එම්. එච්. පත්මානන්ද සිරිවර්ධන මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

#### ඉහත සඳහන් උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළයේ වැලිගම ප්‍රාදේශීය සභා සීමාවේ දෙනිපිටිය හි පිහිටි බේරගමගේහේනවත්ත නැමැති ඉඩමෙන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : මල්වත්ත ද, නැගෙනහිරට : වෙල්ලාලගේවත්ත ද, දකුණට : මහහේනවත්ත සහ සේරතුංගගේ කොරටුව ද, බස්නාහිරට : ආරච්චිගේහේන ද, මායිම්ව රූඩ් තුනක (අ. 0 රූ. 3 පර්. 0) බිම් ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 758/256 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම නැවත මනින ලද පිඹුරේ පහත සඳහන් පරිදි වැඩිමනත්ව විස්තර කර ඇත.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලගම් කෝරළයේ ප්‍රාදේශීය සභා සීමාවේ දෙනිපිටියෙහි පිහිටි බේරගමගේවත්ත නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එම්. ඒ. එස්. ප්‍රේමරත්න විසින් සාදනලද 1991 අප්‍රේල් 24 දිනැති අංක 3756 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් සඳහන් බෙදනලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : පාර සහ මල්ලවත්ත ද නැගෙනහිරටඃ වෙල්ලාලගේ වත්ත ද, දකුණටඃ මහහේනවත්ත සහ ආරච්චිගේවත්ත ද බස්නාහිරටඃ ආරච්චිගේහේන ද, මායිම්ව එකී අංක 3756 දරන පිඹුර අනුව රූඩ් තුනක (අ.0 රූ. 3 පර්. 0) ප්‍රමාණයෙන් යුක්තවේ.

ඩී. පී. කේ. ගුණසේකර,
ප්‍රධාන කළමනාකරු.

අධිශ්‍රේණි ශාඛාව,
ලංකා බැංකුව,
ගාල්ල.

08-190

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී - තලංගම ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. එම්. මොහොට්ටි විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද, 2004.10.26 දින සහ අංක 2516 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ගම්බලගේ ජානක ආනන්ද ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියළුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල 2008 අගෝස්තු මස 20 වැනි දින පෙ. ව. 11.00 ට ඇරඹෙන පරිදි දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

පහත දැක්වෙන චංචල යන්ත්‍රෝපකරණ සහ උපකරණ වල විස්තර

| | *විස්තරය* | *නිෂ්පාදනය /මාදිලිය* | *අනුක්‍රමික අංකය* |
|---|---|---|---|
| 1. | කපන යන්ත්‍රය | හිඩ්ල්බර්ග් | 65512 - 2 |
| 2. | මුද්‍රණ යන්ත්‍රය | හිඩ්ල්බර්ග් /KOR | 563/373 - 753 |

බස්නාහිර පළාතේ. කොළඹ දිස්ත්‍රික්කයේ, අංගොඩ කොටිකාවත්ත අවිස්සාවේල්ල පාරේ, අංක 338/1 හි පිහිටි පරිශ්‍රය තුළ ඒ මත (මෙහි මින්මතු සියල්ල සාමූහිකව බන්ධනදායිගේ චංචල යන්ත්‍රෝපකරණ සහ උපකරණ ලෙස සඳහන් කරනු ලබන) සහ බන්දනදායි විසින් දැන් මින්මතු යම් කාලයක හෝ කලින් කලට හෝ ඉහත කී දිස්ත්‍රික්කය තුළ ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන හෝ මෙය බලාත්මකව පවතින අතර තුර බන්ධනදායින්ගේ චංචල යන්ත්‍රෝපකරණ සහ උපකරණ ගෙන ගොස් තබනු ලබන හෝ තබනු ලබන පරිශ්‍රයන්හි බන්ධනදායි විසින් මින්මතු යම් කාලයක හෝ කලින් කලට බන්ධනදායින්ගේ චංචල යන්ත්‍රෝපකරණ සහ උපකරණ ඉවත් කොට ගෙන ගොස් තබනු ලබන ස්ථානය හෝ ස්ථානයන්හි ඇති ද මෙහි මින්මතු සියල්ල ඒකාරාශීව බන්ධනදායීන්ගේ චංචල යන්ත්‍රෝපකරණ සහ උපකරණ ලෙස සටහන් කරනු ලබන මෙවලම් සහ බඩුබාහිරාදිය ද ඇතුළුව කවර ආකාරයක හෝ සෑම විස්තරයකට ම අයත් චංචල යන්ත්‍රෝපකරණ සහ උපකරණ වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2007.10.05 දින දරන *රජයේ ගැසට් පත්‍රය* හා 2007.11.06 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%)ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%)ක් ද,
4. විකුණුම් කොන්දේසි සහිතක කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහක් (රු. 2,000)ක් ද,
5. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියයි (රු. 500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම වේ.

ගැණුම් මුදලින් ඉතිරි 90% ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සි. වෙත ගෙවිය යුතුය. දින

30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10% අහිමි කිරීමට සහ දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ප්‍රධාන කළමණාකරු (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී අංක 479 ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංක 2661815/2661816 ගෙන් ලබාගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
හා බලයලත් වේනදේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම බ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංකය : 2863121.

08-170

---

### මහජන බැංකුව - තඹුත්තේගම ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඞී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

තලාව - එප්පාවල ප්‍රධාන මාර්ගයට මුහුණ ලා අක්කර 01යි, රූඩ් 01යි, පර්. 16ක් විශාල ඉඩම සහිත දෙමහල් නිවස මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2008.08.06 වැනි දින ප. ව. 1.00 ට දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපල විස්තර :*

*ඉඩම.-* උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ නුවරගම් කෝරළේ, තලාව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ ගල්නෑව ගමේ පිහිටි ගල්නෑව කැලේ නැමැති ඉඩමට 2001.05.19 දින බලයලත් මිනින්දෝරු පී. බී. ඉලංගසිංග මහතා විසින් මැන සාදන ලද අංක 2001/අනු/94 දරන පිඹුර ප්‍රකාර අක්. 01, රූඩ් 01, පර්. 16 ක් විශාල ඉඩම හා ඒ තුළ පිහිටි දෙමහල් නිවස.

*දේපලට පිවිසීම :*

ඉඩම.- තලාව, එප්පාවල ප්‍රධාන මාර්ගයට මායිම්ව බටුවත්ත හි පිහිටා ඇති චතුරාශ්‍රාකාර තැනිතලා සරුසාර පොල් වගාවකින් යුත් ඉඩමකි.

වැඩි විස්තර සඳහා 2003.03.07 දින රජයේ *ගැසට් පත්‍රයේ* සහ 2003.09.19 දින ඩේලි නිවුස්, දිනමිණ සහ තිනකරන් යන පුවත්පත් වල පළ කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිළෙන් 10%ක්,
2. ප්‍රාදේශීය සභා බදු වශයෙන් 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිළෙන් 2.5%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල හා දේපල පැවරුම් ගාස්තු,
6. විකුණුම් සහිතක සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිළෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුව, ගල්කිරියාගම ශාඛාවේ කළමනාකාර වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක 025 - 2222593, 025 - 2223035, 025 - 2222500,
ෆැක්ස් අංකය : 025 - 2235855.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර සඳහා මහජන බැංකුව අනුරාධපුර ප්‍රාදේශිය ප්‍රධාන කාර්යාලයෙන් හෝ ගල්කිරියාගම ශාඛාවෙන් විමසන්න. ඉහත සඳහන් කරන ලද පරිදි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ෂොක්මන් සහ සමරවික්‍රම,
ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම වරලත් වෙන්දේසිකරුවෝ,
(රාජ්‍ය හා පෞද්ගලික බැංකුකරුවන් වෙනුවෙන්
සහ උසාවි කොමසාරිස් වරු).

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංක : 081- 2224371/081-227593,
ෆැක්ස් අංකය : 081- 2224371.
ඊ මේල් : samera@diamond.lanka.net

*ප්‍රධාන කාර්යාලය :*
අංක 55 ඒ, ධර්මපාල මාවත,
කොළඹ 03.
දුරකථන අංක : 011-2448526, 2441761,
ෆැක්ස් අංකය : 011-2448526 , 2575214.
ඊමේල් : samera@srilanka .net

08-220

---

### පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 4 වන වගන්තිය යටතේ විකිණීම

**වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයෙහි, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, අඹගමුවෙහි පිහිටි, බලය ලත් මිනින්දෝරු එච්. ෂොක්මන් මහතා විසින් සකසන ලද, 1964.03.15 දාතමින් යුතු,

පිඹුරුපතෙහි දක්වන ලද, ලෝවර් ඩිවිෂන්, ගලබොඩ ඩිවිෂන්, අපර් ඩිවිෂන් යනාදිය අඩංගු වන 'ගලබොඩ එස්ටේට්' ලෙස හඳුන්වන ඉඩම. එහි පිහිටි තේ හා අනෙකුත් වගාවන්, කර්මාන්ත ගොඩනැගිලි, බංගලාවන්, අනෙකුත් ගොඩනැගිලි සහ පිහිටි සියල්ල සහිතව ඉඩමේ ප්‍රමාණය අක්. 859, රූඩ් 01, පර්චස් 34 1998 ජුනි මස 26 වන දින දරන අති විශේෂ *ගැසට් පත්‍රයේ* I වැනි ඡේදයේ I වැනි කොටසේ විස්තර කර ඇති ඉඩම් ප්‍රමාණය පරිබැහැර කොට අංක 195/6 හා 1982 මැයි මස 31 වැනි දින දරන අති විශේෂ *ගැසට් පත්‍රය* මගින් JEDB වෙත පවරා ඇති සීමා නිර්ණය කර තිබෙන ඉඩම් ප්‍රමාණයක කොටසකි.

එම ස්ථානයට යන ආකාරය හා එහි සිට වැදගත් ස්ථාන සඳහා දුර කොළඹ සිට කොළඹ රත්නපුර - මඩකලපුව A4 මහා මාර්ගය හරහා අවිස්සාවේල්ල දක්වා ගොස්, එහි සිට අවිස්සාවේල්ල - හැටන් A 7 මහා මාර්ගය හරහා ගිනිගත්හේන දක්වා ගොස්, එහි සිට කිලෝ මීටර් 12.3 ගොස් 59/12 වැනි බෝක්කුව අසලින් වම් පසට හැරී ගලබොඩ වත්ත පාර (මවුන්ට් ජීන් වත්ත හරහා) ගොස් දුම්රිය ගේට්ටුව පසු කර, කිලෝ මීටර් 8 ක් පමණ ගිය පසු, ගලබොඩ වත්තට පිවිසිය හැක. මෙහි සිට කිලෝ මීටර් 18.5 ඇතින් හැටන් නගරය ද, කිලෝ මීටර් 22 ක් දුරින් ගිනිගත්හේන ද, කිලෝ මීටර් 124.5 දුරින් කොළඹ ද පිහිටා ඇත.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. අයි. සමරසිංහ විසින් සහතික කරන ලද, 1999 ජුනි මස 24 දිනැති හා 2001 නොවැම්බර් මස 07 දිනැති, අංක 737 දරන හා අංක 1093 දරන උකස්කර ප්‍රකාර හා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. වී. එගොඩගේ විසින් සහතික කරන ලද, 2004 සැප්තැම්බර් මස 02 දිනැති අංක 272 දරන උකස්කරය ප්‍රකාර, උකස්කරු ලෙස අංක 55/75, වොක්ෂෝල් වීදිය, කොළඹ 02 හි පිහිටි ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පීඑල්සී (කලින් පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් හා පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් ලිමිටඩ් ලෙස හඳුන්වනු ලැබූ) උකස් කරන ලදුව, බැඳුම්කරු විසින් ගෙවීම් ඉටුකර නැත.

පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පීඑල්සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ 2008 අගෝස්තු මස 20 වැනි දින (බදාදා) පෙරවරු 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ වකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය*.- මිළ තීන්දු කළ වහා ම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය. -

1. ගැණුම් මිලෙන් 10% ක්,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක පළාත් අධිකාරි බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2%,
4. රු. 90,000 කට අඩු වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැයෙන් 50% ක්,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500.,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු රු. 2000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30 ඇතුළත ගෙවිය යුතු වේ.

තීරණය පිළිබඳ දැන්වීම සඳහා කරුණාකර 2005 අප්‍රේල් මස 25 වැනි දින සිලෝන් ඩේලි නිවුස්, ලක්බිම, සුඩර් ඔලි පුවත්පත් ද 2005 මැයි මස 13 වැනි දින *රජයේ ගැසට් පත්‍රයද* බලන්න.

වැඩි විස්තර හා ඔප්පුව පිළිබඳ ලියකියවිලි, ජ්‍යෙෂ්ඨ කළමණාකරු, නීති අංශය, පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී එල් සී, අංක 450, ගාලු පාර, කොළඹ 03 යන ලිපිනයෙන් පරීක්ෂා කර බැලීමට හා ලබා ගැනීමට හැකිය. දුරකථන අංක 2565573, 2565565.

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමත හා එකම ISO 9001 : 2000
සහතිකය ලත්, ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ, පුරෝගාමී
වරලත් වෙන්දේසිකරුවෝ, උපදේශක
තක්සේරුකරුවෝ සහ ඉඩම් අලෙවි නියෝජිතයෝ.

*ප්‍රධාන කාර්යාලය* :
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081-2227593,
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371.
ඊමේල් : schomankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය* :
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05
දුරකථන අංක : 011-2502680, 2585408,
දුරකථන/ෆැක්ස් අංකය : 011-2588176.
ඊමේල් :schokman@samera1892.com

08-204/1

---

**පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 4 වැනි වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයෙහි, සල්පිටි කෝරළේ, පල්ලේපත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගර සභා සීමාවන් ඇතුළත, නාවල පිහිටි, නාවල පාරෙහි, දැනට වරිපනම් අංක 445 දරන, මිල්ලගහවත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එම්. එල්. එන්. පෙරේරා මහතා විසින් සකසන ලද, 2006 මැයි මස 28 වැනි දින දාතමින් යුතු, පිඹුරුපත් අංක 3551 හි ලොට් අංක 18 ලෙස නිරූපිත බෙදා වෙන් කරන ලද ඉඩම. (මෙම ඉඩම බලයලත් මිනින්දෝරු සිරි. ඩී. ලියනසූරිය මහතා විසින් සකසන ලද 1982 ඔක්තෝබර් මස 29 වැනි දින දරන පිඹුරුපත් අංක 2639 හි ලොට් අංක 18 ලෙස සඳහන් ඉඩමේ නැවත මැනීමක් වන අතර, එම අංක 2639 දරන පිඹුරුපතේ ලොට් අංක 18 වන ඉඩම් කොටස බලයලත් මිනින්දෝරු එස්. කුමාරස්වාමි මහතා විසින් සකසන ලද 1959 අප්‍රේල් මස 24 වැනි දින දරන පිඹුරු පත් අංක 127 හි ලොට් අංක 18 හි නැවත මැනීමකි.)

ඉඩමේ ප්‍රමාණය අක්. 0, රූඩ්. 0, පර්. 20 එහි පිහිටි ගොඩනැගිල සහ සියල්ල සහිතව ද අංක 127 දරන පිඹුරු පතෙහි ලොට් අංක 20 හි දැක්වෙන පාරෙහි මාර්ගය අයිතිය ද සමග,

*ඉඩමට පිවිසෙන ආකාරය*.- මෙම ඉඩමට නාවල මංසන්ධියේ සිට පිවිසීමට (නාවල පාර හා නාරාහේන්පිට පාර සම්බන්ධ වන ප්‍රධාන

මංසන්ධිය) නාවල පාර ඔස්සේ රාජගිරිය දෙසට කිලෝ මීටර 1.2 පමණ ගමන් කරන විට ඔබගේ වම් පසෙහි මෙම ඉඩම පිහිටා ඇත.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. දොලවත්තගේ විසින් සහතික කරන ලද 2006 දෙසැම්බර් මස 28 දිනැති, අංක 2257 දරන උකස්කරය සහ අංක 2259 දරන උකස්කරය ප්‍රකාර, ඔටෝවේ එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී (කලින් පැන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් හා පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් ලෙස හඳුන්වනු ලැබූ) ට උකස් කරන ලදුව, බැඳුම්කරු විසින් ගෙවීම් ඉටු කර නැත.

පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2008 අගෝස්තු මස 28 වැනි දින (බ්‍රහස්පතින්දා) පෙරවරු 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය*.- මිළ තීන්දු වූ වහා ම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය :

1. ගැණුම් මිලෙන් 10% ක්,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක විකුණුම් බදු,
3. ගැණුම් මිල මත වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2 ( 2 1/2 ක් පමණි),
4. රු. 90,000 කට අඩු වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැයෙන් 50%ක්,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500 ,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම සඳහා කරුණාකර 2008 ජූලි මස 04 වැනි දින සිලෝන් ඩේලි නිවුස්, ලක්බිම, සුඩර් ඔලි පුවත්පත් ද 2008 ජූලි මස 18 වන දින *රජයේ ගැසට් පත්‍රය*ද බලන්න.

වැඩි විස්තර හා ඔප්පුව පිළිබඳ ලියකියවිලි, ජ්‍යෙෂ්ඨ කළමණාකරු, නීති අංශය, පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී, 450, ගාලු පාර, කොළඹ 03 යන ලිපිනයෙන් පරීක්ෂා කර බැලීමට හා ලබා ගැනීමට හැකිය. දුරකථන අංක 2565573, 2565565.

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමත හා එකම 9001 : 2000
සහතිකය ලත්, ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ,
පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ,
උපදේශක තක්සේරුකරුවෝ සහ ඉඩම් අලෙවි නියෝජිතයෝ.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081-2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් :schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05,
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011-2588176
ඊමේල් : schokman@samera1892.com.

08-204/2

---

**සම්පත් බැංකුව පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ විකුණුම් නිවේදනය

කොකොවුඩ් එක්ස්පෝර්ට් - ගිණුම් අංක 0030 1000 0881.

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.02.22 වැනි දින යෝජනා කොට සම්මත කරගනු ලැබ 2008.07.11 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද 2008.05.02 වැනි දින දිවයින අයිලන්ඩ් සහ තිනකුරල් යන දිනපතා පුවත්පත් වලද පළකරන ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් තුන්ලක්ෂ හැත්තෑ දහස් හයසිය අසූපහකුත් ශත තිස්හතක (රු. 370,685.37 ක් පමණයි) මුදල සමග තවත් රුපියල් තුන් ලක්ෂ හාරසීයයක (රු.300,400 ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දහනවය (19%) බැගින් 2007 ජුනි 01 වැනි දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදල ද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවා ද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් 2008.08.25 වැනි දින පෙ.ව. 11.00 ට දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

වයඹ පළාතේ පුත්තලම් දිස්ත්‍රික්කයේ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ දකුණු පිටිගල් කෝරලේ කම්මල් පත්තුවේ වෙන්නප්පුවේ, පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ජී. ෂෙල්ටන් සමරතුංග විසින් සාදන ලද 1977 නොවැම්බර් 13 දාතම හා අංක 1222 දරන පිඹුරේ නිරූපිත කෝංගහවත්තේ ප්‍රත්‍යාසන්න ලොට් අංක 02 සහ 03 නමැති වෙළුම/පත් ඉරුව ජී 81/34 හි ලියාපදිංචි කල උතුරට : ගම් සහා පාරද, නැගෙනහිරට: එකී අංක 1222 පිඹුරේ ලොට් 04 සහ 05 ද, දකුණට: පාර සහ එම්. එච්. සයිමන් අප්පුහාමිලාගේ ඉඩමද සහ බටහිරට: ලොට් 01, ද මායිම් වන ප්‍රමාණයෙන් රූඩ් 02 ක් (අක්කර 0, රූඩ් 02, පර්. 0) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කල ඉඩම එහි පිහිටි සෑම සියලු දේ සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

08-186/1

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

සංශෝධිත ගාස්තු

1995 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ.)

1. සියලුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලුම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතුයි.
5. සියලුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති තැනට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ටයිප් ගසා එවිය යුතුයි. අත් අකුරින් යුතු කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.
7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළායයි හැගෙන ප්‍රකාශන සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතෙකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. 1995 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි.

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | 51 0 |
| වැඩිවන සෑම අඟලකටම හෝ ඉන් කොටසකටම | 51 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | 504 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණන ගැසට් පිටුවකටම | 1,008 0 |

(අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ)

11. සෑම සිකුරාදා දියකටම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයකම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියලුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි
13. 1995.01.01 දින සිට සංශෝධිත දායක ගාස්තුව (-

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික)

| | මෙරට රු. ශ. | පිටරට රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II, III ජේද තුනම ඇතුළත්) | 1,612 0 | 2,098 0 |
| II වැනි කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 572 0 | 745 0 |
| I වැනි ඡේදය | 520 0 | 1,007 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර්, විභාග ආදිය) | 624 0 | 1,009 9 |
| III වැනි ජේදය | 468 0 | 907 0 |
| අති විශේෂ ගැසට් පත්‍රය | 3,360 0 | 4,422 0 |

ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ 12 මාසයකට නොඅඩු කාලසීමාවකට පමණය.

* තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | | මිළ ගාස්තුව රු. ශ. | තැපැල් (මෙරටඃ රු. ශ. |
|---|---|---|---|
| (අ) | I වැනි කොටස | 31 0 | 5 0 |
| | II වැනි කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 11 0 | 5 0 |
| (ආ) | I වැනි ඡේදය | 10 0 | 5 0 |
| | II වැනි ඡේදය | 12 0 | 5 0 |
| | III වැනි ඡේදය | 9 0 | 5 0 |

* දායක මුදල් භාරගැනීම සහ තනිපිටපත් විකිණීම භාර රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියළු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් අංක 132, මායා මාවත, කිරුළපන, කොළඹ 05 පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.

සැළකිය යුතුයි. - මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

### *උපලේඛනය*

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2008** | | | |
| අගෝස්තු | 2008.08.01 | සිකුරාදා | 2008.07.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.08.08 | සිකුරාදා | 2008.07.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.08.15 | සිකුරාදා | 2008.08.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.08.22 | සිකුරාදා | 2008.08.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.08.29 | සිකුරාදා | 2008.08.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| සැප්තැම්බර් | 2008.09.05 | සිකුරාදා | 2008.08.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.09.12 | සිකුරාදා | 2008.08.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.09.19 | සිකුරාදා | 2008.09.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.09.26 | සිකුරාදා | 2008.09.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| ඔක්තෝබර් | 2008.10.03 | සිකුරාදා | 2008.09.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.10.10 | සිකුරාදා | 2008.09.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.10.17 | සිකුරාදා | 2008.10.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.10.24 | සිකුරාදා | 2008.10.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.10.31 | සිකුරාදා | 2008.10.17 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.